# ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක උරුමය සංරක්ෂණය කිරීමේදී වෙනිස් ප්‍රඥප්තියේ ඇති වැදගත්කම පිළිබඳව විමසුමක්

ඒ සමිද්ධි හිමි

පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය. samiddhi876@gmail.com

ප්‍රමුඛ පද: පුරාවිද්‍යාත්මක උරුමය, උරුම සංරක්ෂණය, වෙනිස් අදිකාරි ප්‍රඥප්තිය

## හැඳින්වීම

චංචල හා නිශ්චල පුරාවස්තු අභ්‍යන්තර හා බාහිර වශයෙන් දෛනිකව විනාශයට පත්වේ. ස්මාරක පොදු උරුමයන් සේ සලකා ඒවායේ මුල් ස්වරූපය වෙනස් නොකොට හැකාතාක් දුරට අනාගත පරපුරට දායාද කිරීමේ අරමුණින් විවිධ අවස්ථාවල විවිධ ප්‍රඥප්තීන් ප්‍රකාශයට පත්වී තිබේ. මෙහි දී සංරක්ෂණ හා ප්‍රතිසංස්කරණ මූලධර්ම ජාත්‍යන්තර පදනම් මත සකස් කිරීම සඳහා 1964 වර්ෂයේදී ප්‍රකාශයට පත් කරන ලද වෙනිස් අධිකාරි ප්‍රඥප්තිය ඒ අතර වැදගත් කොට සැලකිය හැකිය.

ඒ අනුව මෙම පර්යේෂණ පත්‍රිකාව ඉදිරිපත් කිරීමේ අපේක්ෂාව වන්නේ 1964 වර්ෂයේ මැයි මස 25 දින සිට 31 දක්වා වෙනිසියේ පැවති ඓතිහාසික ස්මාරක පිළිබඳ වාස්තු විද්‍යාඥයන්ගේ සහ කාර්මික ශිල්පීන්ගේ 11 වන ජාත්‍යන්තර සම්මේලනය මගින් ප්‍රකාශයට පත් කරන ලද වෙනිස් ප්‍රඥප්තිය ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක උරුමය සංරක්ෂණය කිරීමේ දී කෙතෙක් දුරට වැදගත් වන්නේද යන්න විමසා බැලීම මෙම පර්යේෂණයේ ගැටලුව වේ. 1964 වර්ෂයේ ප්‍රකාශයට පත්කරන ලද වෙනිස් ප්‍රඥප්තියට අනුව ඕනෑම රටක උරුම සංරක්ෂණ සැලසුම් ක්‍රියාත්මක කිරීමේදී ඒ ඒ රටවල පවතින සංස්කෘතික හා සම්ප්‍රදායන්ට එරෙහි නොවන පරිදි ක්‍රියාත්මක කිරීමේ අවසරය ලබා දී ඇත. එහිදී මූලික සංරක්ෂණ මූලධර්ම උල්ලංඝනය නොකොට තම රටට, සංස්කෘතියට හා සම්ප්‍රදායට ගැලපෙන පරිදි සංරක්ෂණ ක්‍රමවේද වෙනස් කර ගැනීමේ හැකියාව අවධාරණය කර ඇත. මෙම අවකාශය කෙතෙක් දුරට ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක උරුමය සංරක්ෂණය කිරීමේදී ආදේශ කර ගන්නේද යන්න විමසා බැලීම මෙම අධ්‍යනයේ පර්යේෂණ ගැටලුව වන අතර මෙම ප්‍රඥප්තියේ අන්තර්ගත වගන්ති උරුම සංරක්ෂණය සඳහා ආදේශකර ගැනීමේ වැදගත්කම සමාජගත කිරීම මෙහි අරමුණ වශයෙන් පෙන්වා දිය හැකිය.

## ක්‍රමවේදය

මෙම අධ්‍යනයේදී ප්‍රධාන වශයෙන් යොදා ගනු ලබන ක්‍රමවේදය වන්නේ සාහිත්‍යය මූලාශ්‍රය උපයෝගි කර ගැනීමයි. ඒ අනුව 1964 වෙනිස් අධිකාර ප්‍රඥප්තිය හා ශ්‍රී ලංකාවේ සංරක්ෂණ හා ප්‍රතිසංස්කරණ කටයුතු වලදී යොදාගනු ලබන ප්‍රඥප්තීන් හා සෙසු මූලාශ්‍රයන් ප්‍රධාන වශයෙන් උපයෝගි කරගනු ලැබේ. ඊට අමතරව සංරක්ෂණ පසුබිම අවබෝධ කර ගැනීම සඳහා නිරීක්ෂණය, ක්ෂේත්‍ර අධ්‍යනය ආදී ක්‍රමවේද යොදා ගැනීමට අපේක්ෂිතය.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

වෙනිස් ප්‍රඥප්තියේ ස්මාරක පොදු උරුමයක් ලෙස අර්ථ දක්වා තිබීම මෙහිදී

වැදගත් වේ. විවිධ ජාතීන් හා ආගම් රාශියක එකතුවකින් නිර්මිත ශ්‍රී ලංකාව වැනි රටක පුරාවිද්‍යාත්මක උරුමය පොදු උරුමයක් ලෙස සැලකීම ඉතාම වැදගත්ය. එහිදී කිසිදු ජාතියකට හෝ ආගමකට, පාර්ශවයකට අයත් නොවන ශ්‍රී ලාංකේය පුරාවිද්‍යාත්මක උරුමය යන පොදු සංකල්පය සමාජගත කිරීමේ හැකියාව මෙයින් සැලසේ. විශේෂයෙන්ම විවිධ ආගම් හා ජාතීන් නියෝජනය කරන කුරගල වැනි පුරාවිද්‍යාත්මක ස්ථානයක උරුමය සංරක්ෂණය කිරීමේදී මෙම අවකාශයේ වැදගත්කම වඩාත් තීව්‍ර වේ. තවද වෙනිස් ප්‍රඥප්තියේ උරුම සංරක්ෂණ මූලධර්ම දක්වා ඇත්තේ ඒ ඒ සමාජයට, සම්ප්‍රදායට, සංස්කෘතියට එරෙහි නොවන පරිදි සංරක්ෂණ සැලසුම් ආදිය සිදුකල යුතු බවයි. මෙයද ප්‍රඥප්තියේ ඇති ඉතා වැදගත් දෙයක් ලෙස සඳහන් කළ හැකිය. ශ්‍රී ලංකාව වැනි රටක බොහෝවිට උරුම දෙස ඉතා සීමිත පිරිසක් පුරාවිද්‍යාත්මක දෘෂ්ඨියෙන් අධ්‍යනය කලද බොහෝ දෙනෙකුට එම උරුමය ආගමික ස්මාරකයක් විය හැකිය. එවැනි ආගමික ස්ථාන ආශ්‍රිත පුරාවිද්‍යාත්මක උරුමය ජාත්‍යන්තර ප්‍රඥප්තිවල අන්තර්ගත පුරාවිද්‍යාත්මක උරුම දෘෂ්ඨියෙන් පමණක් සංරක්ෂණය කිරීමට උත්සාහ දැරීම විවිධ ගැටලු වලට හේතු වේ. දඹුල්ල,මුල්කිරිගල, හා රම්බාවිහාර ආරාම සංකීර්ණය,කුරගල භූමිය ආදි ස්ථාන ඒ සඳහා නිදසුන් වේ. ඒ අනුව පැහැදිලි වශයෙන්ම ඒ ඒ රටවල හා සම්ප්‍රදායට උචිත වන පරිදි ප්‍රඥප්ති ආදේශ කරගැනීමේ හැකියාව පෙන්වා දීම ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක උරුමය සංරක්ෂණය කිරීමේදී වැදගත් ක්‍රියාවක් ලෙස පෙන්වා දිය හැකිය.මේ පිළිබඳව මෙම ප්‍රඥප්තියේදී අවධානය කර ඇති බව පෙනේ. 1964 වෙනිස් ප්‍රඥප්තියේ ඓතිහාසික ස්මාරක සංරක්ෂණය කිරීමේදී ස්මාරක කේවල උරුමයක් ලෙස නොසලකා සංරක්ෂණය කලයුතු බව අවධාරණය කර ඇත. තවද උසස් ගණයෙහිලා සැලකෙන නිර්මාණ පමණක් ඓතිහාසික ස්මාරක යන සංකල්පයෙන් විග්‍රහ කිරීම බැහැර කල යුතුය යන්න ප්‍රඥප්තියෙන් පෙන්වා දේ. (වෙනිස් අධිකාරී ප්‍රඥප්තිය 1964: 1 වන වගන්තිය)

ඊට අමතරව පුරාවිද්‍යාත්මක උරුමය සංරක්ෂණය කිරීමේදී උරුමය මෙන්ම උරුමය පිහිටි සන්දර්භය පිළිබඳවද විශේෂ අවධානයක් යොමු කොට සංරක්ෂණය කල යුතු බව ප්‍රඥප්තියේ අවධාරණය කර ඇත. යම්කිසි පුරාවිද්‍යාත්මක ස්මාරකයක පිහිටීම මෙන්ම ඒ හා සම්බන්ධ සන්දර්භයද වැදගත් වේ. ඊට ප්‍රධානතම හේතුව වන්නේ ස්මාරකය ඍජුවම සන්දර්භය සමග බද්ධව පවතින නිසාවෙනි. තවද බොහෝ අවස්තා වල ස්මාරකයට වඩා එය පවතින සන්දර්භය පැරණි විය හැකි බැවින් එය ආරක්ෂා කර ගැනීම ඉතා වැදගත්ය. ප්‍රතිසංස්කරණ ක්‍රියාව කෙරෙහිද ප්‍රඥප්තියෙන් අවධානයට ලක් කර ඇත. ඒ අනුව වාස්තුවිද්‍යාත්මක උරුමයන් ආරක්ෂා කිරීමේදී හා අධ්‍යනය කිරීමේදී සියලුම විද්‍යාවන් හා ශිල්පීය ක්‍රමවේදයන් උපයෝගී කර ගත යුතු බව දක්වයි. (වෙනිස් අධිකාරී ප්‍රඥප්තිය 1964: 2 වන වගන්තිය) තවද ස්මාරක සංරක්ෂණය කිරීමේදී හා ප්‍රතිසංස්කරණයේදී ඒවා කලාත්මක නිර්මාණයන් පමණක් වශයෙන් නොව ඓතිහාසික සාධක ලෙසින්ද ආරක්ෂා කිරීම වැදගත් බව ප්‍රඥප්තියේ දපැහැදිලි කරයි. (වෙනිස් අධිකාරී ප්‍රඥප්තිය 1964: 3 වන වගන්තිය)

පුරාවිද්‍යාත්මක උරුමය සංරක්ෂණය කිරීමේදී නඩත්තුවලට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි. ඒ අනුව 1964 වෙනිස් පඥප්තියේ පුරාවිද්‍යාත්මක නඩත්තු කටයුතු වල වැදගත්කම අවධාරණය කර ඇති අතර එහිදී නඩත්තුවේදී ස්ථාවර පදනමකින් එය

සිදුකල යුතු බව පැහැදිලිව පෙන්වා දෙයි. (වෙනිස් අධිකාරි ප්‍රඥප්තිය 1964: 4 වන වගන්තිය) මෙය ශ්‍රී ලංකාවේ ස්මාරක නඩත්තුවේදි මැනවින් අදාළ කරගත හැකිය. ඒ අනුව දෛනිකව,මාසිකව, හා සාමාන්‍ය නඩත්තු වශයෙන්ද රසායනික නඩත්තු, විශේෂ අවස්ථාවන්හිදි සිදුකරන නඩත්තු වශයෙන්ද එම නඩත්තු කටයුතු සිදුකිරිම වැදගත් වේ. තවද ස්මාරක සංරක්ෂණයේදි ඉතා වැදගත් කරුණක් ලෙස යම් ස්මාරකයක් වේ නම් එහි මුල් ස්වරූපය හා අලංකාර සැරසිලි වෙනස් කල නොහැකි බවත් එසේ වෙනස් කරන්නේනම් ප්‍රඥප්ති සීමාවන් තුල පමණක් පිහිටා සිදුකල හැකි බව ප්‍රඥප්තියේ සඳහන් කර ඇත. (වෙනිස් අධිකාරි ප්‍රඥප්තිය 1964: 5 වන වගන්තිය) තවද ස්මාරක සංරක්ෂණයේදි ස්මාරක පිහිටා ඇති වටපිටාවද ඉතිහාසයට සාක්ෂි දරණ හෙයින් ස්මාරකයේ කොටසක් හෝ සම්පූර්ණයෙන්ම හෝ කිසි විටකත් ඉවත් නොකල යුතු අතර ස්මාරකයේ ආරක්ෂාවට අනිවාර්යෙන් එවැන්නක් සිදුකිරිමට වුවහොත් එහිදි ජාතිකව හෝ අන්තර්ජාතිකව එය එසේ ඉවත් කිරිම සාධාරනයැයි පිළිගතහොත් පමණක් ඉවත් කිරිම අනුමත කල හැකි බව ප්‍රඥප්තියේ සඳහන් වේ. (වෙනිස් අධිකාරි ප්‍රඥප්තිය 1964: 7 වන වගන්තිය) තවදුරටත් ඇති වැදගත් කම් විමසා බැලිමේදි ස්මාරකයක ඇති අබන්ධ කොටසක් වන කැටයම්,චිත්‍ර,සැරසිලි කිසි ලෙසකින් ඉවත් නොකල යුතු බව දක්වා ඇත. (වෙනිස් අධිකාරි ප්‍රඥප්තිය 1964: 8 වන වගන්තිය)

1964 වෙනිස් ප්‍රඥප්තියේ පුරාවිද්‍යාත්මක සංරක්ෂණය හා සම්බන්ධ ස්මාරක ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියේදි එය සිදුකල යුතු අයුරු පැහැදිලි කරන අතර ඒ අනුව ප්‍රතිසංස්කරණය ඉහල විශේෂඥ දනුමකින් යුතුව සිදුකල යුතු බවත් ඒ මගින් ස්මාරකයේ සෞන්දර්‍යාත්මක හා ඓතිහාසික අගය ආරක්ෂා කරගනිමින් ඒවාට භාවිත මූල ද්‍රව්‍ය ආදිය පිළිබඳව අවබෝධයක් ලැබිය හැකි බව දක්වයි. තවද සත්‍යවාදි පදනමක පිහිටා වැඩකටයුතු සිදුකල යුතු අතර ස්මාරක ඓතිහාසික හා පුරාවිද්‍යාත්මකව අධ්‍යනය කිරිමෙන් අනතුරුව පමණක් ප්‍රතිසංස්කරණය කිරිම වැදගත් බව අවධාරණය කර ඇත.(වෙනිස් අධිකාරි ප්‍රඥප්තිය 1964: 9 වන වගන්තිය)

තවද සාම්ප්‍රදායික ප්‍රතිසංස්කරණ ක්‍රමවේද ප්‍රමාණාත්මක නොවන්නේ නම් ඒ සඳහා විද්‍යාත්මක ක්‍රමවේද ආදේශ කර ගැනිමේ හැකියාව පවතින බව සඳහන්ය. (වෙනිස් අධිකාරි ප්‍රඥප්තිය 1964: 10 වන වගන්තිය) එසේම සංරක්ෂණය කිරිමේදි ස්මාරකයේ සාම්ප්‍රදායානුකූල පෙනුමට හා සංයුතියට බලපාන පරිදි එහි පිහිටි වටපිටාවට කිසිවක් එකතු නොකල යුතුය යන්න ප්‍රඥප්තියේ අවධාරණය කරයි. (වෙනිස් අධිකාරි ප්‍රඥප්තිය 1964: 13 වන වගන්තිය) කැණිම් කටයුතු කිරිමේදි එය 1956 යුනෙස්කෝව මගින් පිලියෙල කල ජාත්‍යන්තර මූලධර්මට වලට අනුව විද්‍යාත්මක මට්ටමින් සිදුකල යුතු බව පැහැදිලිව දක්වා ඇත. (වෙනිස් අධිකාරි ප්‍රඥප්තිය 1964: 15 වන වගන්තිය)

ඒ අනුව පැහැදිලි වශයෙන්ම ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක උරුමය සුරක්ෂිත කිරිමට නම් 1964 වෙනිස් ප්‍රඥප්තියේ අන්තර්ගත වගන්ති පිලිබඳව විශේෂ අවධානයක් යොමු කල යුතුය. ඒ තුලින් පුරාවිද්‍යා ක්ෂෙත්‍රයේ ඇති කැණිම්, සංරක්ෂණ, නඩත්තු ආදි වූ අංශයන් වඩාත් සාධනීය හා ප්‍රශස්ත මට්ටමකින් ඉදිරියට පවත්වාගෙන යාමේ හැකියාව පවති.

**ආශ්‍රිත ග්‍රන්ථ**


රීඩර, යොසොප් (1991) **ප්‍රකෘතිකරණය හා සංරක්ෂණය.** පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ප්‍රකාශනයකි. කොළඹ.

අග්‍රවාල්, ඕ.පි., ලක්දුණුසිංහ, සිරිනිමල් පරිවර්තක. (1988) **කෞතුක වස්තු සංරක්ෂණ** මූලධර්ම. ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි. කොළඹ 07 .

(The vanis charter 1964) International charter for the conservation and restoration of monuments and sites